" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204. டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204. Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.11.25 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක **GOS/ADM/12/8/19** හා **2021.11.24** දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.10.07 MH/TA/G/PSM/05/2020 | කොවිඩ් 19වසංගත කාල සීමාවේදී ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නිරත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අතිකාල දීමනා ලබා දීම. |
| 02 | 2021.10.07 01-33/2021 | 1997.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් නොලැබීම. |
| 03 | 2021.10.05 02-75/2021 | ශ්‍රී ලංකා හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීම් සඳහා සලකා බලනු ලබන කාලසීමාව සංශෝධනය කිරීම. |
| 04 | 2020.01.17 01-07/2020 | මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් (ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම්)සඳහා වූ මාසික බිල්පත් නිරවුල් කිරීමට අනුමැතිය ලබා දීම. |
| 05 | 2021.05.21 09/2021 (රා.ප. චක්‍රලේඛයකි) | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම. |
| 06 | 2021.06.30 14/2021 (රා.ප. චක්‍රලේඛයකි) | ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම. |
| 07 | 2021.10.22 02/2021 (රා.ප. චක්‍රලේඛයකි) | කොවිඩ් 19 ආසාධිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම. |

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640 Fax : 0112092636 dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532 Fax : 0112092533 dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501 Fax : 0112092505 dcs@eng.wpc.gov.lk | Tel : 0112092628 Fax : 0112092625 cia@cs.wpc.gov.lk |

| | | |
|---|---|---|
| 08 | 2021.11.05<br>23/2021<br>(රා.ප. චක්‍රලේඛයකි) | රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත "ඉ-ග්‍රාම නිලධාරි " පද්ධතියට ඇතුලත් කිරීම. |

**02.** එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2021

මගේ අංකය : IAD/ADM/GA02/Sports-Youth Affairs
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.06.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම

2021.03.30 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ඩන්කන් වයිට් මහතා ඔලිම්පික් තරඟාවලියේ දී රිදී පදක්කමක් දිනා ගත් දිනය වන ජූලි මස 31 වන දිනය, 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සෑම වර්ෂයකම **"ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා දිනය"** වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර ඇත. නිරෝගිමත් පරපුරක් ඇතිකරලමින් කාර්යක්ෂම, ඵලදායී මානව සම්පතක් බිහි කිරීම ජාතික ක්‍රීඩා දිනයක් ප්‍රකාශ කිරීමේ අරමුණ වේ.

02. ඒ අනුව 2021 ජූලි මස 31 වන දිනය ජාතික ක්‍රීඩා දිනය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇතත් මෙම වර්ෂයේ ජූලි මස 31 වන දිනය සෙනසුරාදා දිනයක් වන බැවින් **ජූලි මස 30 වන සිකුරාදා දිනය** ජාතික ක්‍රීඩා දිනය ලෙස සලකා අදාළ ක්‍රීඩා ප්‍රවර්ධන හා ශාරීරික යෝග්‍යතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී ඇත.

03. නිරෝගිමත් රාජ්‍ය සේවක පරපුරක් බිහිකිරීම මඟින් කාර්යක්ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමේ අරමුණින් සියළුම රාජ්‍ය ආයතන තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2020 අනුව කටයුතු කළ අයුරින් මෙවර ද **එනම් 2021 ජූලි මස 30 වන දින පෙ.ව 8.30 සිට** පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කළ යුතු ය. **එහිදී වර්තමානයේ රට මුහුණ පා සිටින කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට ද අනුගතව සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.**

i. කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිටදී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා විසින් ජාතික ධජය එසවීම.

ii. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

iii. ආයතන නිලධාරීන් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් තුළින් ඵලදායී සේවයක් ලබා දීම සඳහා ව්‍යායාම, දේශීය ආහාර හා පෝෂණයෙහි ඇති වැදගත්කම පිළිබඳව කෙටි දේශනයක් පැවැත්වීම.

iv. ආයතන නිලධාරීන් සම්බන්ධ කර ගෙන කාර්යාලයීය ඇඳුමින් සහභාගී විය හැකි සරළ ව්‍යායාම වැඩසටහනක් (මිනිත්තු 15ක) පැවැත්වීම.

04. නිරෝගිමත් පරපුරක් ඇතිකරලමින් කාර්යක්ෂම, ඵලදායී මානව සම්පතක් බිහි කිරීමේ අරමුණ සාර්ථක කර ගැනීම සඳහා උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම චක්‍රලේඛය ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම අනුව නිකුත් කරනු ලබන අතර මේ පිළිබඳව වැඩිදුරටත් තොරතුරු ක්‍රීඩා අමාත්‍යාංශය විමසා ලබා ගත හැකි ය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :-

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු. දැ.ගැ.ස

02. ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස